# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2254/6 - 2021 නොවැම්බර් මස 15 වැනි සඳුදා - 2021.11.15**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 5/2011/(iii)

**2008 අංක 40 දරන ජාතික මංමාවත් පනත**

2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ 13 වන සහ 14 වන වගන්ති සමග කියවිය යුතු, එකී පනතේ 89 වන වගන්තිය යටතේ මහාමාර්ග අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

**ජොන්ස්ටන් ෆ්‍රේවියර් ප්‍රනාන්දු,**
මහාමාර්ග අමාත්‍ය.

2021 නොවැම්බර් මස 15 වැනි දින.
බත්තරමුල්ලේ දී ය.

නියෝග

1. මෙම නියෝග 2021 අංක 1 දරන ජාතික මංමාවත් (භාවිත කිරීමේ ගාස්තු) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මෙම නියෝග 2021 නොවැම්බර් මස 3 වන දින අංක 2252/26 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ 11 වන වගන්තිය යටතේ සාදන ලද නියමයක් මගින් ප්‍රකාශයට පත් කරන ලද "ගාස්තු ගෙවිය යුතු මීරිගම - කුරුණෑගල ජාතික මහා මාර්ගය (මධ්‍යම අධිවේගී මාර්ගයේ කොටස)" සම්බන්ධයෙන් අදාළ වේ.

3. (1) ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ග භාවිත කරන සෑම වාහනයක රියදුරෙකු විසින්ම ඒ මහා මාර්ගය භාවිත කිරීම සම්බන්ධයෙන් මෙම නියෝගවල උපලේඛනයේ "අ" කොටසේ නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණ පරිදි ගාස්තු ගෙවනු ලැබිය යුතු ය.

(2) ජාතික මහා මාර්ගයේ සම්පූර්ණ දුර ප්‍රමාණය හෝ ඉන් කොටසක් සම්බන්ධයෙන් එම ගාස්තුව අයකරගනු ලැබිය යුතු ය.


1A - PG 5615 - 110 (2021/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(3) විවිධ වර්ගවලට අයත් වාහන සඳහා විවිධ ගාස්තු නියම කරනු ලැබිය යුතු ය.

(4) භාවිත කිරීමේ ගාස්තුව අතින් මුදල් ගෙවීමෙන් සිදුකළ යුතුය.

4. (1) යම් අන්තර් හුවමාරුවකින් ගාස්තු ගෙවීමේ මහා මාර්ගයට ප්‍රවේශ වන රියදුරෙකු විසින් ගාස්තු ගෙවිය යුතු මහා මාර්ගයේ ගමන් කිරීමට අවසර ලබා දීමට පෙරාතුව ඒ අන්තර් හුවමාරුවේ සේවයේ යෙදී සිටින අයකැමිගෙන් ප්‍රවේශ පත්‍රයක් ලබා ගත යුතු ය.

(2) මේ නියෝගයේ (1) වන අනුනියෝගය යටතේ ප්‍රවේශ පත්‍රයක් ලබා ගෙන ඇති සෑම රියදුරකු ම එම ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගයෙන් පිටවීම සඳහා ඔහු අපේක්ෂා කරන අන්තර් හුවමාරුවේ ගාස්තු ගෙවීමේ ස්ථානයට ළඟා වන තෙක් එම ප්‍රවේශ පත්‍රය ඔහුගේ සන්තකයේ සුරක්ෂිතව තබාගත යුතු ය.

(3) ගාස්තු ගෙවීමේ ජාතික මහා මාර්ගයෙන් පිටව යෑමේ අරමුණින් යම් වාහනයක් අන්තර් හුවමාරුවේ ගාස්තු ගෙවීමේ ස්ථානයකට පැමිණි විට, එම වාහනයේ රියදුරු විසින් ඔහු ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගයට ප්‍රවේශවීමේ දී අන්තර් හුවමාරුවෙන් ලබා ගත් ප්‍රවේශ පත්‍රය අයකැමි යටතට පත් කළ යුතු ය.

(4) වාහන සඳහා ගෙවිය යුතු ගාස්තුව අයකැමි විසින් රියදුරු වෙත දැනුම් දිය යුතු අතර, ඒ අනුව අන්තර් හුවමාරුවෙන් පිටවී යෑමට අවසර ලබාදීමට ප්‍රථමයෙන් රියදුරු විසින් ඒ මුදල ගෙවිය යුතු අතර, අයකැමි විසින් ඒ ගෙවීම වෙනුවෙන් ලදු පතක් නිකුත් කළ යුතු ය.

(5) රියදුරු විසින් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අවස්ථාවක දී ජාතික මහා මාර්ගයේ වඩාත්ම දුරින් පිහිටි ප්‍රවේශයේ සිට සැබැවින්ම පිට වූ ස්ථානය දක්වා වූ සම්පූර්ණ දුර ප්‍රමාණය සඳහා ඔහු විසින් ගාස්තු ගෙවිය යුතු අතර, ඒ සඳහා මෙම නියෝගවල උපලේඛනයේ "අ" කොටසේ නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණ මත වූ ගාස්තුවක් අයකරගනු ලැබිය යුතු ය.

5. (1) මෙම නියෝගවල විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා ජාතික මහා මාර්ගයේ අවශ්‍ය ස්ථානවල ප්‍රමාණවත් ගේට්ටු සංඛ්‍යාවක් සවිකර ඇති බවට (මෙහි මින්මතු "අධිකාරිය" යනුවෙන් හඳුන්වනු ලබන) 1981 අංක 73 දරන මාර්ග සංවර්ධන අධිකාරිය පනත යටතේ පිහිටුවා ඇති මාර්ග සංවර්ධන අධිකාරිය වගබලා ගත යුතු ය.

(2) අධිකාරිය විසින්, එසේ ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගයේ සවිකරන ලද ගේට්ටුවල අයිතිය, පාලනය සහ නඩත්තුව දැරිය යුතු අතර, ඒ එක් එක් ගේට්ටුව අයකැමියකු විසින් හසුරුවනු ලැබිය යුතු ය.

(3) අයකැමි විසින්, (2) වන ඡේදයේ දක්වා ඇති සෑම ගේට්ටුවක දී ම ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගයක් භාවිත කරන සෑම රියදුරකුගෙන්ම මෙම නියෝගවල උපලේඛනයේ "අ" කොටසේ නිශ්චිතව දක්වා ඇති වාහන වර්ග සඳහා වූ අනුප්‍රමාණ මත වූ ගාස්තු, භාවිත කිරීමේ ගාස්තු වශයෙන් එකතු කර ගත යුතු ය.

එසේ වුව ද, මෙම නියෝගවල උපලේඛනයේ "ආ" කොටසේ නිශ්චිතව දක්වා ඇති ගාස්තු ගෙවීමෙන් බැහැර කොට ඇති වර්ගයක වාහනයක් පදවන රියදුරකු සම්බන්ධයෙන් මෙම නියෝගවල විධිවිධාන අදාළ නොවිය යුතු ය.

(6). අධිකාරිය විසින්, නිශ්චිතව සඳහන් කර ඇති යම් වේලාවන්හි දී, දිනය තුළ එකතු කළ ගාස්තු අයකැමි විසින් අධිකාරිය විසින් තත්කාර්යය සඳහා බලය දෙන ලද නිලධරයකු වෙත භාරදිය යුතු අතර, එසේ භාර දුන් මුදල් සම්බන්ධයෙන් කුවිතාන්සියක් ලබාත යුතු ය.

(7) ගාස්තු ලෙස එසේ එකතු කරගත් මුදල් අධිකාරියේ අරමුදලට බැර කරනු ලැබිය යුතු අතර, මෙම නියෝග අදාළ වන ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගය සංවර්ධනය කර පවත්වාගෙන යාමේ කාර්ය සඳහා එම මුදල් භාවිත කරනු ලැබිය යුතු ය.

(8) මෙම නියෝගවල කාර්ය සඳහා

" අයකැමි'' යන්නෙන්, අන්තර් හුවමාරුවක හෝ නම් කරන ලද ස්ථානයක ගේට්ටු හසුරවනු ලබන නිලධරයකු අදහස් වේ;

"ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ග'' යන්නෙන්. ගාස්තු ගෙවිය යුතු මීරිගම-කුරුණෑගල ජාතික මහා මාර්ගය (මධ්‍යම අධිවේගී මාර්ගයේ කොටස) මීරිගම (කි. මී. 36.981) සිට කුරුණෑගල (කි. මී. 77.891) දක්වා අදහස් වේ.

උපලේඛනය

**අ කොටස**

(3 වන සහ 5 වන නියෝග)

| 1 වන වර්ගයට අයත් වාහන (ඇක්සල 2 ක් සහ රෝද 4ක් ඇති වාහන හෝ ඇක්සල 2ක් සහ රෝද 6ක් සහිත ද්විත්ව කාර්ය වාහන) සඳහා ගෙවිය යුතු ගාස්තු ප්‍රමාණයන් (රු.) | | | | |
|---|---|---|---|---|
| දුර | 17.81 | කි.මී. 14.79 | කි.මී. 5.45 | කි.මී |
| | මීරිගම උතුර අන්තර් හුවමාරුව | නාකලගමුව අන්තර් හුවමාරුව | දම්බොක්ක අන්තර් හුවමාරුව | කුරුණෑගල අන්තර් හුවමාරුව |
| නාකලගමුව අන්තර් හුවමාරුව | 150 | | | |
| දම්බොක්ක අන්තර් හුවමාරුව | 200 | 150 | | |
| කුරුණෑගල අන්තර් හුවමාරුව | 250 | 150 | 100 | |
| යග්ගපිටිය අන්තර් හුවමාරුව | 250 | 150 | 100 | |

| 2 වන වර්ගයට අයත් වාහන (ඇක්සල 2 ක් සහ රෝද 6 ක් ඇති වාහන ) සඳහා ගෙවිය යුතු ගාස්තු ප්‍රමාණයන් (රු.) | | | | |
|---|---|---|---|---|
| දුර | 17.81 | කි.මී. 14.79 | කි.මී. 5.45 | කි.මී |
| | මීරිගම උතුර අන්තර් හුවමාරුව | නාකලගමුව අන්තර් හුවමාරුව | දම්බොක්ක අන්තර් හුවමාරුව | කුරුණෑගල අන්තර් හුවමාරුව |
| නාකලගමුව අන්තර් හුවමාරුව | 200 | | | |
| දම්බොක්ක අන්තර් හුවමාරුව | 300 | 200 | | |
| කුරුණෑගල අන්තර් හුවමාරුව | 350 | 250 | 150 | |
| යග්ගපිටිය අන්තර් හුවමාරුව | 350 | 250 | 150 | |

| 3 වන වර්ගයට අයත් වාහන (ඇක්සල 2 කට වැඩි වාහන) සඳහා ගෙවිය යුතු ගාස්තු ප්‍රමාණයන් (රු.) | | | | |
|---|---|---|---|---|
| දුර | 17.81 | කි.මී. 14.79 | කි.මී. 5.45 | කි.මී |
| | මීරිගම උතුර අන්තර් හුවමාරුව | නාකලගමුව අන්තර් හුවමාරුව | දම්බොක්ක අන්තර් හුවමාරුව | කුරුණෑගල අන්තර් හුවමාරුව |
| නාකලගමුව අන්තර් හුවමාරුව | 300 | | | |
| දම්බොක්ක අන්තර් හුවමාරුව | 500 | 250 | | |
| කුරුණෑගල අන්තර් හුවමාරුව | 550 | 350 | 150 | |
| යග්ගපිටිය අන්තර් හුවමාරුව | 550 | 350 | 150 | |

සටහන : දෙපසටම එකම ගාස්තුව

**ආ කොටස**

(5 වන නියෝගය)

ගාස්තු ගෙවිය යුතු ජාතික මහාමාර්ග භාවිත කරන්නන් සඳහා වූ ගාස්තු ගෙවීමෙන් බැහැර කර ඇති වාහන

1. ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගය ඔස්සේ යම් තාක් දුරක් යම් අවස්ථාවක දී ගමන් කරනු ලබන ජනාධිපති ආරක්ෂක රථ පෙළට අයත් වන සියලු වාහන.

2. ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගය ඔස්සේ යම් තාක් දුරක් යම් අවස්ථාවක දී ගමන් කරනු ලබන අගමැති ආරක්ෂක රථ පෙළට අයත් වන සියලු වාහන.

3. ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගය භාවිත කරනු ලබන ගිලන්රථ.

11-673

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.